researchers perception were correct. A survey of that nature was necessary. As there is a tendency for analysts to impose his or her perceptions and interpretations of needs on their learners which are unnecessary and unattainable (Halliday and Cooke in West (ed) 1992. However the statistics in the questionnaire dispel this doubt.

The most outstanding contribution of the grid: **"The assistance it renders to divide long sentences into manageable sense groups."** is the task which deficiency analysis too selects as its first priority.

The 2nd most useful contribution of the grid is **"the opportunity it affords learners to formulate questions."** This language area was not included in the Deficiency Analysis for comment, as the primary concern of that scrutiny was only identifying the impediments related to reading.

**"Helping to distinguish relevant data from irrelevant data in constructions"** which is another contribution of the grid is the 3rd priority according to the survey, incidentally this is the 3rd most difficult language task in relation to reading according to the Deficiency Analysis; As well 4th and 5th contributions of the grid respectively are: "providing a syntactic frame work to form new constructions" and "enabling the reader to see short paragraphs as coherent wholes." Despite the low priority score the latter received it is a useful language skill which can "wean away" students from "their obsession with words" and encourage them to exploit their innate powers of inference and prediction from linguistic evidence (Chitravely 1980 in Reading in a Foreign Language)

### 11. Conclusion

As can be seen from the facts above there is no significant correlation between some of the needs identified through the Deficiency Analysis and the competencies imparted by the grid. For instance problem related to vocabulary.

which is the 2nd priority of the Deficiency Analysis is not addressed by the grid. At the same time there are no references in the Deficiency survey to 3 of the competencies, namely to 3rd, 4th and 5th language skills which the grid helps to promote. Cause of this mismatch is the diverse aims. The researcher used the Deficiency Analysis to obtain data related to reading problems exclusively, and the aim of the other survey was getting as much information as possible about the grid.

However, with hindsight it is felt that qustionnaire is not comprehensive, particular in relation to its range. Yet grid appears to have met participants needs in a large measure statistics in Data Analysis prove that.

# 56

# පරිවර්තන සාහිත්‍යය පිළිබඳ අදහස් කිහිපයක්

*මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතාන ගමගේ*

## පරිවර්තනයේ ස්වභාවය

'පරිවර්තනය' යන වචනය මූලික වශයෙන් ම 'වෙනස් වීම' හෙවත් 'එක් තත්ත්වයක සිට තවත් තත්ත්වයකට පත්වීම' යන අර්ථය දෙයි. සොබා දහම පිළිබඳ ව සිතා බැලීමේ දී එහි පැවැත්ම සිදු වන්නේ ඉහත කී 'පරිවර්තනය' හෙවත් 'වෙනස් වීම' අනුව බව වැටහී යයි. සොබා දහමට අයත් සියල්ලෙහි 'මූලික ධර්මතාව' මෙයයි. සියල්ල පවතින්නේ එම මූලික ධර්මතාවට අනුවය යන්න පිළිබඳ විවාදයක් නැත. මානව මානසික ලෝකයට අයත් 'සාහිත්‍යය' නම් විෂයයෙහි එන 'පරිවර්තනය' නම් කාර්යය ද මෙම 'ධර්මතාවට ම' අයත්ය යන්න මගේ වැටහීමයි.

## මානව ශිෂ්ටාචාරය හා පරිවර්තනය

සොබා දහමට අයත් විශිෂ්ට අංගයක් ලෙස හැඳින්විය හැකි මානව ශිෂ්ටාචාරයෙහි ආරම්භයේ පටන් ම 'පරිවර්තන' කාර්යය සිදු වී ඇති බව පෙනී යයි. පරිසරයෙහි තමා දකින දෑ මානවයා කිසියම් ආකාරයක සංකේත රූසකට පරිවර්තනය කළේය. එය ගුහා බිත්තියක් මත, ගසක කඳක් මත, මැටි පුවරුවක් මත සටහන් කළේය. එය, එක් මානව කණ්ඩායමක සිට තවත් මානව කණ්ඩායමක් දක්වා ගමන් කිරීමේ දී තව තවත් වෙනස්කම්වලට භාජනය විය. භාෂාව නමැති මෙවලම සාදා ගන්නට පෙර ද මෙසේ යම් යම් ආකාරවල 'පරිවර්තන' සිදු නොවුණා නො වේ. එය, එක්තරා ආකාරයකට මානව කණ්ඩායම් සංවිධානය වීමේ දී අනන්‍යතා ප්‍රදර්ශනය කරනු වස් භාවිත වී ඇති බව පෙනී යයි.

## භාෂාව හා සංස්කෘතිය

භාෂාව නමැති මෙවලම මානව ශිෂ්ටාචාරය නව මගකට යොමු කළේය යන්න විවාදයකින් තොර ව පිළිගත හැකි කරුණකි. කණ්ඩායම් වශයෙන් සංවිධානය වූ සමාජ රාශියක් තමතමන්ගේ ස්වභාවික පරිසරයන්ට අනුකූල 'භාෂා' සම්මත කර ගති. මුවින් පිටවන ශබ්ද 'අක්ෂර සංකේත' බවට පරිවර්තනය කර ගති. එක් එක් කණ්ඩායම්

තමන්ට පිටස්තර 'භාෂා' මුණගැසුණු විට ඒවා තම බසට පරිවර්තනය කර ගැනීම ආරම්භ කළ අතර, එහි දී මුවින් පිට වූ ශබ්ද සහ අක්ෂර සංකේත යන දෙවර්ගය ම අදාළ විය. එය, එක්තරා ආකාරයකට එක් කණ්ඩායමක් සතු 'දැනුම' හෙවත් ඔවුන්ගේ 'චින්තනය' තමන්ට ලබා ගැනීම වාසිදායක වූ හෝ වන හෝ නිසා සිදු වූ සංසිද්ධියක් ලෙස හැඳින්වීම සාවද්‍ය නො වේ. ක්‍රමයෙන් එක් එක් සමාජ කණ්ඩායමට අදාළ 'සංස්කෘතිය'ක් ද බිහි වන්නට පටන් ගත් අතර, එහි ප්‍රධාන වාහකයා වූයේ භාෂාව නමැති මෙවලමයි. 'භාෂා පරිවර්තනය' යන්න පොදුවේ සැලකිල්ලට භාජනය වූ, සමාජයට අත්‍යවශ්‍ය විෂයයක් වුව ද, නිසැකව ම එහි දී බොහෝ විට සිදු වූයේ 'භාෂා පරිවර්තනය' නොව 'සංස්කෘති පරිවර්තනයකි'.

භාෂාවේ ආධාරයෙන් සිය චින්තනය හා බැඳුණු 'මානසික ලෝකය' පාදක කොට ගෙන සිය 'මානසික ඉතිහාසය' අන්‍යයන්ට ඉදිරිපත් කරනු පිණිස දැරුණු ප්‍රයත්න නිසා 'සාහිත්‍ය ලෝකය' බිහි විය. එය භාෂාව මාධ්‍යය කර ගනිමින් සමාජයට ඉදිරිපත් විය. 'කියවීම මිනිසා සම්පූර්ණ කරයි' වැනි අදහස් සමාජයට අත්‍යවශ්‍ය, වැදගත් දේ යැයි පිළිගැනෙන්නට පටන් ගැනිණි. තමාට අදාළ සමාජයෙහි ඇති දෑ පිළිබඳ ව දැනගන්නට ඇති වූ කුහුල ක්‍රම-ක්‍රමයෙන් අන් සමාජවල ඇති තතු දැන ගැනීම දක්වා වර්ධනය වන්නට විය. 'පරිවර්තන කාර්යය' එම හිඩැස පිරවීමට ඉදිරිපත් විය. ලෝකයේ මානව සමාජ අතර ඇති 'චින්තන දුරස්ථතාව' ක්‍රමයෙන් තුනී වී යන්නට පටන් ගැනිණි.

විවිධ හේතූන් නිසා මානව සමාජ අභ්‍යන්තරයෙහි ඇති වන ගැටුම් හා එයට පාදක වන සාධක සියුම් ලෙස අධ්‍යයනය කිරීමේ දී ප්‍රධාන වශයෙන් මතු වී පෙනෙන්නේ 'භාෂා හා සංස්කෘතික' ගැටලු මතින් ඒවා නිර්මාණය වී ඇති බවයි. විවිධ භාෂා කතා කරන, විවිධ සංස්කෘතීන්ට අනුකූල ව එක ම සමාජයක ජීවත්වන මිනිසුන් අතර ඇතිවන ගැටලු කුමන ස්වරූපයකින් පැන නැගුණත් ඒවායේ මුල් හේතු, භාෂාව සහ සංස්කෘතිය යන සාධකවලට පරිබාහිර ව තිබෙන ඒවා නොවන බව පෙනී යයි. කුමන රටක වුව ද තමා ජීවත්වන සමාජය මෙහෙයවන කණ්ඩායමක් සේ ගැනෙන දේශපාලකයන් සිය යහපත්-අයහපත්, පුළුල්-පටු උවමනාවන් සඳහා භාෂාව සහ සංස්කෘතිය යන උභය සාධක මනා ව භාවිත කරන බව පැහැදිලි ව ම පෙනී යයි. අදාළ සමාජයන්හි සාහිත්‍යකරුවන් සහ ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ මෙහි යථා ස්වභාවය පෙන්නුම් කරන කැටපත් වැනිය. සියුම් මෙන් ම දුරදක්නා නුවණක් ඇති සාහිත්‍යකරුවන් සහ පරිවර්තකයන් සමාජයකට ලැබුණු මහඟු දායාද වැනිය. ඒ මන්ද යත්, භාෂා-සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් ඒ ඒ මානව කණ්ඩායම් යා කිරීම සඳහා ඔවුන් අතින්



නිමවෙන භාෂා-සංස්කෘතික හේතු නිසාමය. මෙහි දී පරිවර්තකයාගේ භූමිකාව ඉතා ප්‍රබල මෙන් ම අතිශය වැදගත්කමකින් ද යුතු වෙයි.

## සාහිත්‍ය ප්‍රගමනයෙහි ලා පරිවර්තනයෙහි දායකත්වය

බොහෝ කාලයක් තිස්සේ ලෝකය පුරා විහිදී පැතිරී ගිය මානව සමාජ තමතමාට අනන්‍ය භාෂා-සංස්කෘතික තත්ත්වයන් විවිධතා සහිත ව පවත්වා ගෙන එන බව පැහැදිලි කරුණකි. ඒ ඒ භාෂාවට අනුව යමින් මිනිසුන් ඉදිරිපත් කළ සිතුම්-පැතුම් සියල්ල විවිධ මුහුණුවරින් සාහිත්‍යය මගින් ඉදිරිපත් වී ඇත. ප්‍රධාන වශයෙන් සමාජ, ආර්ථික හා දේශපාලන සාධක පදනම් කරගෙන ඒවායේ ප්‍රමාණයන්හි වෙනස්කම් දක්නට ලැබෙයි. වඩාත් සශ්‍රීක සමාජ, ආර්ථික සහ දේශපාලන තත්ත්වයන් ළඟා කර ගැනීමේ පරමාර්ථයෙන් ම කෙරෙන භාෂා-සංස්කෘතික පරිවර්තන සමග නිර්මාණය වන එම සාහිත්‍යයන් වඩාත් සමාජයට බලපෑම් ඇති කරන ආකාරය දැකිය හැකිය. සාහිත්‍යයෙහි අරමුණ 'ආනන්දයෙන් ප්‍රඥාව කරා යෑම බව පිළිගත් මතයකි. ඒ සඳහා විවිධ භාෂා-සංස්කෘතික පරිවර්තන තම සාහිත්‍යයන්ට එක් කර ගැනීම ඉහත අරමුණ සාක්ෂාත් කර ගැනීමට පිටුබලයක් සපයයි. වෙනත් භාෂා-සංස්කෘතික සමාජයක චින්තනයෙහි ඇති දාර්ශනික අදහස් පරිශීලනය කිරීමට ලැබීමෙන් පුද්ගලයා විශ්ව-චින්තකයෙකු බවට පත් වීමත්, එයින් අදාළ සමාජය හා සම්බන්ධ සාහිත්‍යය වඩා වඩා පෝෂණය වීමත් අනිවාර්යයෙන් ම සිදු වන්නකි. භාෂා-සංස්කෘතික පරිවර්තනයන්හි වැදගත්කම කෙතරම් ද යන්න මෙයින් පැහැදිලි වෙයි.

## පරිවර්තනය පර්යේෂණාත්මක කාර්යයකි, පරිවර්තකයා පර්යේෂකයෙකි.

වර්තමානයේ, ලේඛකයකු ලෙස ප්‍රසිද්ධියට පත් වන්නට ඇවැසි ප්‍රධානතම සාධකය වනුයේ 'පොතක් පරිවර්තනය කිරීමය' යන්න ගැඹුරට කිඳා බැස ඇති මතයක් බව පෙනී යයි. එහෙත්. 'පරිවර්තනය' යනු එලෙසින් සරල ලෙස විග්‍රහ කළ හැකි ක්ෂේත්‍රයක් නො වේ. මගේ වැටහීම අනුව ස්වතන්ත්‍ර නිර්මාණයක් ඉදිරිපත් කිරීම පහසු කටයුත්තකි. ඒ මන්ද යත්, එහි දී ඉදිරිපත් කිරීමට සිදු වන්නේ තමාගේ නිර්මාණ කුසලතාවල මට්ටම් අනුව තමාගේ සිතුම්-පැතුම් වචනවලට පෙරළීම පමණක් වන නිසාය. එහෙත්, පරිවර්තනය යන්න එසේ නො වේ. මුල් ලේඛකයාගේ සිතුම්-පැතුම් අදාළ පාඨක සමාජයට නිවැරදි ව, සිත්ගන්නාසුලු සහ සමීපත්වයකින් යුතු ව ඉදිරිපත් කිරීම පහසුවෙන් කළ හැකි කටයුත්තක් යැයි සිතීම මුලාවක් පමණි. මන්ද යත් අප විසින්

මේ සිදු කරනු ලබන්නේ හුදු 'භාෂාවකින්' 'භාෂාවකට' කරන පරිවර්තනයක් නොවන නිසාය. එම නිසා ස්වතන්ත්‍ර නිර්මාණයකට සූදානම් වීමට වඩා වැඩි සූදානමක් පරිවර්තන කාර්යය සඳහා තිබිය යුතුය. පරිවර්තකයා මුල් කෘතිය හොඳින් මෙන් ම අවබෝධයෙන් පරිශීලනය කරමින් අදාළ ලේඛකයාගේ නිර්මාණාත්මක දාර්ශනික චින්තාව අවබෝධ කර ගැනීමට උත්සාහ කළ යුතුය. ලේඛකයාගේ ජීවන පසුබිම, නිර්මාණ පසුබිම, වස්තුවිෂය හා අදාළ සමාජ, සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන පසුබිම, යනාදිය විචක්ෂණයෙන් හැදෑරිය යුතුය. අවබෝධ කර ගත යුතුය. මේ සියල්ල පර්යේෂණාත්මක පසුබිමක් යටතේ සිදු විය යුතුය. එයින් අදහස් කෙරෙන්නේ වඩා විධිමත් අධ්‍යයනයක් සිදු විය යුතුය යන්නයි. පරිවර්තනය සඳහා කෘති තෝරා ගැනීමේ දී අදාළ මුල් බස පිළිබඳ දැනුමක් තිබීම අතිශය වැදගත් සාධකයකි. මුල් බසින් වෙනත් බසකට පෙරළන ලද කෘතියක් පදනම් කොට ගෙන පරිවර්තනයක් සිදු කිරීමට යෑමේ දී මුහුණ දෙන්නට වන ප්‍රධාන ගැටලුව වන්නේ එම පරිවර්තනය පිළිබඳ ඇති විශ්වසනීයත්වය කෙතෙක් ද යන්න පිළිබඳවය. කෘතියෙහි මුල් බස හා තමන්ගේ බස පිළිබඳ මනා පරිචයක් සහිත පරිවර්තකයෙකුට මෙම පර්යේෂණය වඩාත් පහසුවෙන් සිදු කළ හැකිය. විශේෂතම කාරණය වන්නේ 'පරිවර්තකයා තමන්ගේ හෘදය සාක්ෂ්‍යය සමග කටයුතු කරන පුද්ගලයකු' වීමයි. මන්ද යත්, කුමක් හෝ ලියා ඉදිරිපත් කිරීම සැබෑ පරිවර්තන කාර්යයක් නොවන බැවිනි. මේ කරුණු සලකා බැලීමේ දී පරිවර්තකයකු වීම සැබවින් ම අභියෝගාත්මක කාර්යයකි. ඔහු විසින් සිදු කරනු ලබන්නේ හුදු භාෂා පරිවර්තනයක් නොව, සංස්කෘතික පරිවර්තනයක් ම වන නිසාය. ඒ සඳහා පරිවර්තකයා බොහෝ සුදුසුකම් සැපිරිය යුතුය. පරිවර්තනයේ 'සාර්ථකත්වය රඳා පවතින්නේ' පරිවර්තකයාගේ 'කැපවීමේ ප්‍රමාණය' නම් සාධකය මතය යන්න මගේ වැටහීමයි. එහෙයින් සැබෑ පරිවර්තකයා හැම විට ම පර්යේෂකයෙකු විය යුතුමය.

## සමකාලීන පරිවර්තන සාහිත්‍යය

සමකාලීන පරිවර්තන සාහිත්‍යය දෙස බැලීමේ දී පෙනී යන ප්‍රධාන ම කරුණ වන්නේ එහි පරාසය පෙරට වඩා පුළුල් වී ඇති ආකාරයයි. මෙය පැති ගණනාවකින් විමසා බැලිය යුතු වෙයි.

කලකට ඉහත දී කෘතහස්ත පරිවර්තකයන් සුළු පිරිසකට සීමා වී තිබුණු පරිවර්තන සාහිත්‍යය, මුද්‍රණ හා වෙනත් තාක්ෂණික මෙවලම් නිෂ්පාදන කර්මාන්තයන්හි ඇති වූ වේගවත් දියුණුව හේතුවෙන් සුදුසුකම් ඇති හෝ සුදුසුකම් නැති ඕනෑ ම කෙනෙකුට ස්වතන්ත්‍ර



ලේඛන හා පරිවර්තන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට මග පෑදී ඇත. එය වර්තමානයේ අර්බුදයක් වන තැනට ම පත් වී ඇති සැටියක් පෙන්නුම් කරයි. අප විසින් සිතා බැලිය යුතු කරුණක් වන්නේ ඉහත කී දියුණුවට සාපේක්ෂ වශයෙන් සාහිත්‍ය නිර්මාණකරුවන් සහ පරිවර්තකයන් දියුණු වී ඇත්ද යන්නයි. ප්‍රශ්නය ඇත්තේ එතැන බව පැහැදිලි ව ම පෙනී යයි. තාක්ෂණයේ දියුණුවට සාපේක්ෂ ව වඩා හොඳ ස්වතන්ත්‍ර නිර්මාණකරුවන් සහ පරිවර්තකයන් සමාජයට දායාද වූයේ නම් තාක්ෂණ දියුණුවේ ප්‍රයෝජනය සමාජ ප්‍රගමනය සඳහා ඉවහල් කර ගන්නට අවස්ථාව තිබිණි යැයි මට හැඟෙයි.

පෙර දී පොත් ප්‍රකාශයකයන්ගේ භූමිකාව ඉදිරිපත් කළ පිරිසට වඩා විශාල පිරිසක් වර්තමානයේ පොත් ප්‍රකාශනයට එක් වී ඇත. එහි යහපත් මෙන් ම අයහපත් පැති ද දක්නට ලැබෙයි. සමාජයේ ඇති අනෙකුත් 'රැළි' හෙවත් 'ප්‍රවණතා' මෙන් පරිවර්තන සාහිත්‍යයේ ස්වභාවය තීරණය කරන තීරණාත්මක 'ප්‍රවණතා' ද ඇති බව පෙනී යන්නේ, වර්තමාන බොහෝ පොත් ප්‍රකාශකයන් විසින් මතුරනු ලබන මන්ත්‍රයක් අසන්නන්ට ලැබීමෙනි. ඒ කෙසේ ද යත්, 'පරිවර්තන නවකතාවලට නම් හොඳ ඉල්ලුමක් තියෙනවා, පරිවර්තන කෙටිකතා නං විකිණෙන්නෙ නැහැ. හොඳ නවකතාවක් පරිවර්තනය කරල ගේන්නකො. අපි මුද්‍රණය කරන්නම්'

මෑතක දී පොත් සාප්පුවක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගි වූ අවස්ථාවේ ප්‍රසිද්ධ පොත් ප්‍රකාශක මහත්මයකු මට හමු විය. එතුමා මගෙන් විමසා සිටියේ 'පරිවර්තන එහෙම මුකුත් කරල තියෙනව ද ඔබතුමා?' යනුවෙනි. 'කෙටිකථා කීපයක් නං පරිවර්තනය කරල තියෙනවා මුල් භාෂාවෙන් ම. එතකොට ජනකතා පොත් 5ක් විතරත් මුල් බසින් ම සිංහලට පරිවර්තනය කරල තියෙනවා' මම පිළිතුරු බැන්දෙමි. 'අයියෝ පරිවර්තන කෙටිකථා නං විකිණෙන්නෙ නෑ. එතකොට ජනකතා... ඒකටත් එච්චර ඉල්ලුමක් නෑ. නවකතාවක් පරිවර්තනය කරල දෙන්නකො ඉක්මනට.' එතුමා මගෙන් ඉල්ලා සිටියේය. මේ සංවාදය සමකාලීන පරිවර්තන සාහිත්‍යයෙහි ඇති ස්වභාවය පෙන්නුම් කරන බව මගේ හැඟීමයි.

වෙළඳපොළෙහි ඇති පරිවර්තන කෘති සංඛ්‍යාව වේගයෙන් වැඩි වෙමින් පවතින බව පෙනී යයි. ඒ අතර නවකතා ප්‍රමුඛස්ථානයක් ගනී. මෙහි වේගය කොතරම් වැඩි වී ඇත්ද යත් ඒවා කියවන්නට කාලයක් නැති තරම්ය. බොහෝ කෘතිවල පිටු කිහිපයක් පෙරළා බැලීමේ දී පෙනී යන්නේ අදාළ කෘතියෙහි ඉංග්‍රීසි පරිවර්තනය පාදක කොට ගෙන මෙම කෘතිය සිංහලට නැගූ බවයි. මුල් බසින් ම ලියැවුණු කෘති පරිවර්තනය වීම ඉතා අල්ප බව ද පෙනී යයි.

කලකට ඉහත දී පරිවර්තකයකු විසින් පරිවර්තනය කරන ලද කෘති

නැවතත් වෙනත් පරිවර්තකයන් විසින් නැවත සිංහල බසට පරිවර්තනය කොට වෙළඳපොළට මුදා හැරීම ද තවත් එක් ප්‍රවණතාවක් ලෙස පෙනී යයි. මේ හා සම්බන්ධයෙන් අසන්නට ලැබුණු තොරතුරුවලට අනුව, සිදු වී ඇත්තේ කලින් පරිවර්තනය ම සුළු-සුළු වෙනස්කම් සහිත ව නැවත ඉදිරිපත් කිරීමකි. මෙය ඉතා නරක ප්‍රවණතාවකි.

සාහිත්‍ය සම්මාන උළෙලවල දී පරිවර්තන සාහිත්‍යයට යම් ඉඩක් වෙන් කර දී තිබීම අතිශය ප්‍රශංසනීය කරුණකි. ඒ මගින් සැබෑ පරිවර්තකයන් පිරිසක් බිහි කිරීමත්, උසස් පරිවර්තන සාහිත්‍යයක් බිහි කිරීම සඳහා මංපෙත් විවර කිරීමත් සිදු වේ යැයි විශ්වාස කරමු.

හැදෑරිය යුතු විෂයයක් වශයෙන් ‘පරිවර්තනය’ විශ්වවිද්‍යාල විෂය මාලාවලට එක් වී තිබීම ද ප්‍රශංසා කටයුතුය. මෙහි දී සිදු කෙරෙන සිද්ධාන්ත සහ ප්‍රායෝගික අධ්‍යයනයන් උසස් පරිවර්තක පරපුරක් බිහි කරන්නට සිදු කෙරෙන විශිෂ්ට ආයෝජනයක් සේ සැලකීම යුක්තියුක්තය.

පරිවර්තන සාහිත්‍යය හා සම්බන්ධ විචාර ක්ෂේත්‍රය පුළුල් විය යුතුය. එය ඉතා පසුගාමී තත්ත්වයක පසුවන බව පෙනී යයි. ඒ සඳහා සුදුස්සන් සොයා ඔවුන්ට දිරි දීම වර්තමාන සමාජයෙහි යුතුකමකි. එමෙන් ම, ජනමාධ්‍යයන්හි ඒ සඳහා ප්‍රමාණවත් ඉඩක් වෙන් කර දීම අත්‍යවශ්‍යය.

මගේ වැටහීමට අනුව නම්, කෙතරම් දුරට පරිවර්තන සාහිත්‍යය ගැන සාකච්ඡා කළත්, ස්වතන්ත්‍ර නිර්මාණ කරන ලේඛකයා හැම විට ම ප්‍රථම ස්ථානයෙහි තැබිය යුතුය, ඔහු අද්විතීයය. පරිවර්තකයා හැම විට ම ද්විතීයිකය. එහෙත්, මේ උභය පාර්ශවයන් සාහිත්‍යයෙහි ප්‍රගමනයට ලබා දෙන දායකත්වය සමානය.

# 57

# Aspects of Sri Lanka’s Footprints of the Buddha

***Professor Kayoko Kusumoto***

## Introduction

Sri Lanka has footprints of the Buddha carved in stone slabs distributed across a wide area of the Island. They are found mainly at ancient temple sites. Motoji Niwa says that there are approximately 1,000 such footprints in existence, and that they are unique in the world([1]).

The Buddha in the absolute reality is the Body of Law (*dharmakâya)* according to both Thçravâda and Mahâyâna Schools. The Body of Law is the series of the pure *dharma* as Vasubandhu says([2]). The *Mahâvastu* of *Mahâsânghikas* says *Tathâgatas* are born with a body made of mind ([3]). So the Buddha’s physical body is not real Buddha ([4]). The *Tathâgata* or the body of Law (*dharmakâya)* is arisen from the *dharma* or the *Brahma* which is the course and effect (*paliccasamuppada*)([5]). Sakyamuni achieved this Body of Law with the enlightenment under the Bô-tree at Bodh Gaya, India. Since then he has been conventionally called the Buddha. But he declared that his humanly physical body is not the Buddha([6]).

Early Buddhist attributed the physical body of the Great man endowed with thirty-two characteristics to the formless Buddha and created the anthropomorphic Symbol of the Great Man. And They used it as a one of the Buddha–symbols to help the followers of Buddha Sakyamuni to recall the real Buddha–the Body of Law. In this way they seemed to have guided by the Buddha’s words in the *Lakkhâna sutta* of the *Dîgha Nikâya* where Buddha says that a great man 2nd owed with the thirty–two characteristics becomes either universal-ruler or a Buddha .Several of these characteristics relate to the feet.0The feet have a level tread on the sole of the feet are the wheel-signs with thousand spokes; tyre and hub ;the heels protect out ; the toes are long ; the feet are soft and tender ; and they resemble a net;([7]).

Chutiwongs referring to the footprint of the Buddha says” most of them were not meant to represent imprints of the Buddha’s feet but they